චක්‍රලේඛ අංක :- PRE/2024/16

මගේ අංකය:-TR/PRE/CIR/2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2024.07. 

TR - 02

ඉතා වැදගත්

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්,**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**ජනාධිපතිවරණය - 2024.09.21**
**පොදු 231 ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.**

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ මූලික සංවිධාන කටයුතු වල නිරත වන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමට හා ඡන්ද විමසීමේ දී ඡන්ද පොළ කාර්ය මණ්ඩල ප්‍රවාහනය හා ඒ හා සබැඳි අනෙකුත් කටයුතු සඳහා ගනු ලබන රජයේ වාහන සඳහා ණය පහසුකම් යටතේ පොදු 231 ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමේ දී පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

I. අවශ්‍ය ඉන්ධන ඇණවුම් පොත් ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගැනීමේ දී අවශ්‍යතාවය පිළිබඳ පූර්වයෙන් සලකා බලා අවශ්‍ය ප්‍රමාණයට පමණක් ඉන්ධන ඇණවුම් ලේඛන ප්‍රසම්පාදන ශාඛාවෙන් ලිඛිතව ඉල්ලුම් කර ලබා ගත යුතුය.

II. සෑම ඉන්ධන ඇණවුම් පොතක සෑම ඇණවුමකම පහත ආදර්ශය පරිදි සකස් කර ගත් රබර් මුද්‍රාවක් තැබිය යුතුය.

ELECTIONS
1 ½ cm
5 cm

III. එසේ ලබා ගන්නා ඉන්ධන ඇණවුම් ලේඛන විධිමත්ව ලේඛනගත කර ලේඛනයේ අනු අංක පිළිවෙලට පොත් නිකුත් කිරීම හා භාරගැනීම කළ යුතුය.

IV. පොත් කිහිපයක් එකවර භාවිතා නොකිරීම හා එක් පොතක් අවසන් වූ පසු පමණක් ඊළඟ පොත භාවිතයට ගැනීම.

V. ඉන්ධන ලබා ගැනීම සඳහා අමුණා ඇති ආකෘතිය පරිදි සකසා ගත් අයදුම්පතක් රියදුරු මහතුන් ලවා සම්පූර්ණ කරවා ගැනීම. (ඇමුණුම - **V - 2)**

VI. ඉටු කිරීමට නියමිත රාජකාරියට ප්‍රමාණවත් වන පරිදි පමණක් ඉන්ධන ප්‍රමාණය ගණනය කර ලබාදීම. (කිසි විටකත් අනවශ්‍ය පරිදි ඉන්ධන නිකුත් කිරීමෙන් වැළකිය යුතුය)

VII. හැකි සෑම විටම ඉන්ධන ලබා ගැනීමට ප්‍රථම ධාවන සටහන් තුලනය කර ඉදිරිපත් කරන ලෙසට රියදුරන් දැනුවත් කරන්න.

VIII. ඉන්ධන නිකුත් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අවශ්‍ය විස්තර එහි ඇතුළත් කිරීම. එසේ ඇතුලත් කරන විස්තරවලට පහත දැක්වෙන තොරතුරු ද අඩංගු විය යුතුය. ඉදිරි විගණන කටයුතු වලදී මෙම ලේඛනය අවශ්‍ය වන හෙයින්, ඡන්ද විමසීම නිමවී සති දෙකක් ඇතුළත මෙම ලේඛනය නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් භාරයට ගැනීමට කටයුතු කරන්න.

**ඉන්ධන නිකුත් කිරීම සඳහා භාවිත කරන ලේඛනයේ සටහන් තබා ගැනීම පිළිබඳ ආදර්ශය**

1. වාහනයේ අංකය
2. වාහනය අයත් ආයතනයේ නම හා ලිපිනය
3. රියදුරු මහතාගේ නම
4. ඉන්ධන ඇණවුම් අංකය
5. ඉන්ධන වර්ගය (ඩීසල් ද / පෙට්‍රල් ද )
6. නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය
7. එන්ජින් ඔයිල් / බ්‍රේක් ඔයිල් ලබා දුන්නේ ද

8. ඉන්ධන ඇණවුම අත්සන් කරන මාණ්ඩලික නිලධාරියාගේ කෙටි අත්සන හා දිනය
9. ඉන්ධන ඇණවුම ලබාගත් රියදුරුගේ අත්සන
10. ඉන්ධන ඇණවුම සම්පූර්ණ කළ නිලධාරියාගේ කෙටි අත්සන

02). ඉන්ධන ඇණවුම් අත්සන් කිරීම නිලධාරීන් දෙදෙනෙකුට හෝ උපරිම තිදෙනෙකුට සීමා කරන්න. එසේ ඉන්ධන ඇණවුම් අත්සන් කිරීමට බලය දී ඇති නිලධාරීන්ගේ නම්, නිල නාම, රාජකාරී ලිපිනයන් සහ ආදර්ශ අත්සන් ඉන්ධනහල් හිමියන් වෙත කල් වේලා ඇතිව ලබාදිය යුතුවේ. ඉන්ධන ඇනවුම් අත්සන් කරනු ලබන එකී නිලධාරි ලැයිස්තුව කාර්යාල ගොණුවේ සුරැකිව තබා ගැනීමට ද කටයුතු කරන්න.

03). මෙසේ ඇණවුම් මගින් නිකුත් කරනු ලබන ඉන්ධන ලබා ගැනීම සඳහා වාහනයේ රියදුරු සමඟ සෑම විටම කළමනාකරණ සේවා නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු යැවිය යුතුය. අදාළ නිලධාරියා ඉදිරිපිටදී වාහනයේ ටැංකියට ඉන්ධන පිරවූ බවට ඇණවුමේ වම්පස ඉහළ කෙළවරේ සටහනක් යෙදිය යුතු අතර, එම සටහන පහත ආදර්ශ පරිදි රබර් මුද්‍රාවකින් තැබීමට කටයුතු කළ යුතුය.

| | |
|---|---|
| මා ඉදිරියේදී අංක ........................................ දරණ වාහනයේ ඉන්ධන ටැංකියට පෙට්‍රල් / ඩීසල් ලීටර්.............ක් පුරවන ලදී.<br>මයිලෝ මීටරයේ කියවීම. | |
| .................................... | ........................... |
| දිනය/වේලාව | අත්සන |

04). සංචිත වාහන වලට **(Pool Vehicles)** මෙන්ම නිලධාරීන් විසින් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා රැගෙන එන වෙන්කළ වාහන **(Assigned Vehicles)** සඳහා ද ඉන්ධන ලබාදීමේදී මෙම විධිවිධානයන් අනුගමනය කළ යුතු බව කාරුණිකව සළකන්න.

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් :
01. විගණකාධිපති
02. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව
03. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ ) - කාරුණික දැන ගැනීම සඳහා
04. ප්‍රධාන මූල්‍ය නිලධාරි - අවශ්‍ය කටයුතු සඳහා
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අවශ්‍ය කටයුතු සඳහා
06. ගණකාධිකාරී (ප්‍රසම්පාදන) - ඒ ඒ දිස්ත්‍රික්ක වෙතින් ඇණවුම් කරනු ලබන ඉන්ධන ඇණවුම් ලේඛන ප්‍රමාණය සළකා බලා අවශ්‍ය පරිදි ලබා දීමට.

# ජනාධිපතිවරණය - 2024.09.21

## පොදු 231 ඉන්ධන ඇනවුම් මගින් සංචිත වාහන වලට / නිලධාරීන් රැගෙන එන වෙන්කල වාහන වලට ඉන්ධන නිකුත් කිරීම.

01. වාහන අංකය : ..........................................................................................

02. වාහනය අයත් ආයතනය : ..........................................................................................

03. මාණ්ඩලික නිලධාරියෙකු රැගෙන එන වාහනයක් නම්

(I) නිලධාරියාගේ නම : ..........................................................................................

(II) තනතුර : ..........................................................................................

04. රියදුරුගේ නම : ..........................................................................................

05. මයිලෝ මීටරයේ කියවීම : ..........................................................................................

06. අවශ්‍ය ඉන්ධන වර්ගය (පෙට්‍රල්/ ඩීසල් ) :........................................

07. ඉන්ධන දැවීම ලීටරයට කිලෝමීටර් : ..........................................................................................

08. දැනට ටැංකියේ ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් : ..........................................................................................

09. ටැංකියේ මුළු ඉන්ධන ධාරිතාවය ලීටර්: ..........................................................................................

10. ඉල්ලුම් කරනු ලබන ඉන්ධන ප්‍රමාණය ලීටර් : ..........................................................................................

ඉහත අංක දරණ වාහනයට ඉන්ධන ලීටර් * පෙට්‍රල්/ ඩීසල්..................... ක් ලබාදෙන්න.

නම : ................................................

තනතුර :................................................

අත්සන :................................................

දිනය : ................................................

..........................................................................................................................................

### කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අංක ................................. දරණ වාහනයට ඉන්ධන * පෙට්‍රල්/ ඩීසල් ලීටර් ........... ක් නිකුත් කිරීම

* අනුමත කරමි / අනුමත නොකරමි.

..................................................

සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)/
ඉන්ධන ඇණවුම් අනුමත කිරීමට බලයලත් නිලධාරියා

ඉහත අංක දරණ වාහනයට ඉන්ධන ලීටර් ...................... ක් ලබා ගැනීමට අංක ............................ දරණ ඇණවුම නිකුත් කරන ලදී.

..................................................

දිනය : ................................. ප්‍රවාහන අංශයේ කාර්ය මණ්ඩල නිලධාරී

(* අනවශ්‍ය වචන කපා හරින්න.)